# සංක්ෂිප්තය


මුල් ළමාවිය පුද්ගල සංවර්ධනයේ ඉතාම වැදගත් යුගයකි. ළමාවියේ අවුරුදු 2-6 අතර කාලය, පෙර පාසල් විය ලෙස සැලකේ. මෙම කාලයේ දී දරුවාගේ සීඝ්‍ර සංවර්ධනයක් සිදුවේ. මෙම යුගයේ දී ඇති වන සංවර්ධනය පුද්ගලයෙකුගේ අනාගත පෞරුෂය කෙරෙහි සෘජුවම බලපානු ලැබේ. වත්මන් ශ්‍රී ලාංකීය තරුණ පරපුර දෙස බැලීමේ දී ඔවුන් තුළින් සාරධර්ම ඇත් වී යන බවක් විද්‍යාමාන වේ. පාසල් යන දරුවෝ විවිධ සමාජ විරෝධී ක්‍රියාවන්වලට යොමු වීම ඉතා සීඝ්‍රයෙන් ඉහළ යන බව විවිධ සිදුවීම්වලින් සනාථ වේ. ඒ අනුව අනාගත සමාජයට හිමිකම් කියන දරුවන් තුළ පෙර පාසල් අවධියේ දීම යහපත් සමාජ චර්යා සංවර්ධනය ආරම්භ කිරීම කාලෝචිත වේ. එබැවින් පර්යේෂිකාව මුල් ළමාවියේ දරුවන් තුළ යහපත් සමාජ චර්යා සංවර්ධනය සඳහා පෙර පාසල්වල දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් ලෙස මෙම අධ්‍යයනය සිදු කිරීමට තෝරා ගැනුණි.

අධ්‍යයනයට අදාළව න්‍යායාත්මක හා ආනුභාවික සාහිත්‍ය විමර්ශනය සිදුකෙරිණි. මෙහිදී යහපත් සමාජ චර්යා අර්ථකථනය කිරීමත්, මුල් ළමාවියට අදාළ වයස් සීමාවන් හඳුනා ගැනීමත්, යහපත් සමාජ චර්යා පිළිබඳ න්‍යායන් හඳුනා ගැනීම සහ පෙර පාසල් අධ්‍යාපනයේ අරමුණු පිළිබඳව සොයා බලන ලදී. ආනුභාවික විමර්ශනය මඟින් දේශීය හා විදේශීය පර්යේෂණ සාහිත්‍ය පරිශීලනයක් සිදුවිය.

මෙම අධ්‍යයනය සඳහා ඒ අනුව පර්යේෂණ අරමුණු 04 ක් ඔස්සේ මෙම ගැටලුව පිළිබඳ අධ්‍යයනය සිදුවිය. එහිදී සුවිශේෂී අරමුණු ලෙස පෙර පාසල මඟින් දරුවන් තුළ වර්ධනය කළයුතු යහපත් සමාජ චර්යා විමසා බැලීම, දරුවන් තුළ යහපත් සමාජ චර්යා සංවර්ධනයට පෙර පාසල් අනුගමනය කරන ක්‍රියාමාර්ගවල දායකත්වය පිළිබඳ ගුරු සංජානන විමසා බැලීම, දරුවන් තුළ යහපත් සමාජ චර්යා සංවර්ධනයට පෙර පාසල් අනුගමනය කරන ක්‍රියාමාර්ගවල දායකත්වය පිළිබඳ දෙමාපිය සංජානන විමසා බැලීම, දරුවන් තුළ යහපත් සමාජ චර්යා සංවර්ධනයට පෙර පාසල් අනුගමනය කරන ක්‍රියාමාර්ගවල දායකත්වය ඉහළ නැංවීමට යෝජනා ඉදිරිපත් කිරීම යොදා ගැණිනි.

මෙහිදී බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් නියදිය සඳහා තෝරා ගන්නා ලදී. ඒ අතුරින් පෙර පාසල් 10 ක්, පෙර පාසල් ගුරුවරියන් 20 ක් හා දෙමාපියන් 10 දෙනෙකු නියදියට ඇතුළත් කර ගන්නා ලදී. නියදියට අදාළව දත්ත රැස් කිරීම සඳහා නිරීක්ෂණ පත්‍රිකාවක්, ප්‍රශ්නාවලිය සහ සම්මුඛ සාකච්ඡා නියමාවලි යොදා ගන්නා ලදී. රැස්කර කර ගත් දත්ත වගු, ප්‍රස්තාර හා ප්‍රතිශත ලෙස ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම මඟින් මෙන්ම සාරාංශගත, විස්තරාත්මක, ව්‍යුහාත්මක සන්ධාර විශ්ලේෂණය යන විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම මඟින් ද විශ්ලේෂණය කරන ලදී. දත්ත අර්ථකථනය අධ්‍යයනයේ අරමුණු මූලිකව සිදුකරන ලදී.

එහිදි අධ්‍යයන නියදියේ ගුරුවරියන් සියලු ම දෙනාම පෙර පාසල් ප්‍රඥප්තියේ ඇති සුදුසුකම් සපුරා ඇති බවත් සෑම ගුරුවරියක්ම පෙර පාසලක ඉගැන්වීම පිළිබඳ වසරකට වඩා වැඩි පළපුරුද්දක් ඇති අය බවත් අනාවරණය විය.

දරුවන් තුළ යහපත් සමාජ චර්යා සංවර්ධනයට දෛනිකව පෙර පාසල් තුළ විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන බවත්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී ද විවිධත්වයකින් යුතු ක්‍රියාකාරකම් අනුගමනය කරන බවත්, යහපත් සමාජ චර්යා සංවර්ධනය සඳහා විශේෂ වැඩ සටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරන බවත්, පෙර පාසල් ගුරුවරියන් විසින් ජාතික වශයෙන් හඳුනාගෙන ඇති අරමුණුවලට අනුකූලව පෙර පාසල් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන බවත් අනාවරණය විය. යහපත් සමාජ චර්යා සංවර්ධනය සඳහා ගෙදර පරිසරය, සමවයස් කණ්ඩායම් පෙර පාසල් පරිසරය, ජනමාධ්‍ය හා අසල් වැසියන් යන සාධක බලපාන බව අනාවරණය විය.

දෙමාපියන් තම දරුවාට පෙර පාසල් අධ්‍යාපනය ලබාදීමේ ප්‍රධාන අරමුණ වන්නේ දරුවාගේ බුද්ධි සංවර්ධනය උදෙසා බව අනාවරණය විය. එම අනාවරණයන්ට අදාළව නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීමේ දී ඉදිරි පර්යේෂණ ක්‍රම, යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයෙන් සිදුකරන ලදී.

# Abstract

Early childhood is one of the most important period in personal development. The age between 2 to 6 is considered as the pre-school stage. During this period a rapid development in the child takes place. The development which takes place during this stage directly influences the potential personality. When the young generation in Sri Lanka is considered, it is apparent that they move away from the ethics and values. When looking at various incidents it is clear that some of the school going students tend to move rapidly towards the anti-social activities. So it is a timely need to start the development of good social behaviour in the children who will own the future society.

The theoretical and empirical literature review was done in relevance to the study. In doing so defining good social behaviour, identifying the age limit relevant to early childhood and the objectives of pre-school education were studied. Local and foreign literature was referenced in the empirical literature review.

In the research, this problem was studied in four research objectives. Here, finding out activities carried out by pre-schools for developing good social behaviour in children, teacher perception of the contribution of the activities carried out by pre-schools for developing good social behaviour in children, parents' perception of the contribution of the activities carried out by pre-schools for developing good social behaviour in children and providing suggestions to enhance the contribution of the activities carried out by pre-schools for developing good social behaviour in children were used as specific objectives.

As the sample of the study the pre-schools in the Badulla divisional secretary were selected. According to that 10 pre-schools, 20 pre-school teachers and 10 parents were included. For collecting data an observation sheet, questionnaire and interviews were used. Collected data was analyzed using the

quantitative analysis methods like tables, graphs and percentages as well as through comprehensive analysis methods like summarized structured data analysis.

Here, it was revealed that the pre-school teachers selected for the sample have fulfilled the requirements and qualifications of the pre-school act and all the pre-school teachers have more than one year experience in teaching in a pre-school.

It was revealed that various daily activities for developing the good social behaviour in children are done and in the learning-teaching process a variety of activities are done to develop good social behaviour and also specific activities are carried out for good social behaviour development by the pre-school teachers which are compatible with the national objectives. And it was also revealed that the factors like home environment, peer groups, pre-school environment, mass media and neighbours affect the development of good social behaviour in children.

This study revealed that it was for the intellectual development of the child that parents expect in providing pre-school education. Future research methods and recommendations were done according to the findings of this research study.